# නූතන ඩොයිලිලා

සිංහල බුද්ධාගම ගැන ලියා ඇති ඊනියා සමාජවිද්‍යාඥයන්ට හා මානවවිද්‍යාඥයන්ට ඒ හසු වී ඇත්තේ බටහිර මතවාදවලට සාපේක්ෂව බැවින් ඔවුන් ලියා ඇති දේ අසංගත ය. එක් සමාජවිද්‍යාඥයකු යැයි කියන්නකු සිංහල භික්ෂූන්වහන්සේ දේශපාලනයට පිවිසියේ දහනවවැනි සියවසින් පසුව යැයි කියා වත්මන් භික්ෂූන්වහන්සේ දේශපාලනයෙන් ඉවත්කිරීමට මානබලන අතර තවත් ඊනියා සමාජවිද්‍යාඥයෙක් ආදිකාලීන සිංහල භික්ෂූන්වහන්සේ රජුන්ගේ කාර්යය කෙරූ අය ලෙස හඳුන්වයි. (අප විරුද්ධ භික්ෂු දේශපාලනයට නොව භික්ෂු පක්ෂ දේශපාලනයට ය.) මොවුන්ට තමන් මේ පවසන්නේ කරුණු දෙකක් බවත් ඒ කරුණු අතර පරස්පරයක් ඇති බවත් අමතක වූවා සේ ය. එහෙත් ඔවුන්ට ඒ ප්‍රශ්නයක් නො වෙයි. කෙදිනකවත් සංගතභාවය යන්න ලිපියක හෝ ලිපි මාලාවක තිබිය යුතු ප්‍රධානම ගුණයක් ලෙස සැලකීමට පුරුදු වී නොමැති මොවුන්ට මේ කරුණු ගැන අවධානය යොමුකිරීම අනවශ්‍ය ය. ඔවුන් මේ කිසිවක් කරන්නේ සිංහල බුද්ධාගම යනු මේ යැයි දැනගැනීමේ ශාස්ත්‍රීය චේතනාවකින් නොව තම බටහිර ස්වාමිවරුන් සතුටුකරමින් සිංහල භික්ෂූන්වහන්සේ ද ඇතුළු සිංහල බෞද්ධයනට පහර දීමට ය. බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ සුවච සේවකයන් වූ මේ කසිකබළුන් ගැන සතිපතා නොව දිනපතා ලිවීමට කරුණු ඇතිමුත් එදිනෙදා සිදුවන දෑ පිළිබඳ විවරණයක් කිරීමට සිදුවන බැවින් මේ සතියේ ද ඔවුන් නොසලකා හැරීමට සිදුවෙයි.

එහෙත් මෙහි සාකච්ඡා කෙරෙන කරුණ වුව ද මුළුමනින් ම සිංහල බුද්ධාගමින් වියෝවූවක් නො වෙයි. මෙයට පෙර සොල්හයිම් මහානායක හිමිවරුන් බැහැදැක උන්වහන්සේලා ඉදිරියේ දණින් වැටී අටපිරිකර පූජාකළ අන්දම ගැන සඳහන් කෙළෙමු. පසුගිය සතියේ මෙරට ඇමරිකන් තානාපතිවරයා දළදාවහන්සේ පුදනු අපි ජනමාධ්‍යයෙන් දුටුවෙමු. ඔහු දියවඩන නිළමේ සමග දළදාවහන්සේට වඳිනු අපි ඡායාරූපවලින් දුටුවෙමු. මෙරට ඇමරිකන් තානාපතිවරයා බෞද්ධයකු දැයි අපි නො දනිමු. ඔහු ඇමරිකා එක්සත් ජනපදයෙන් මෙහි පැමිණ තිසරණ සහිත පන්සිල් සමාදම් වී බෞද්ධයකු වූ ඕල්කට්තුමා මෙන් බෞද්ධ වූ බවක් ද අපි අසා නැත්තෙමු.

දළදාවහන්සේට වැඳිය හැක්කේ බෞද්ධයනට පමණක් දැයි බටහිර ක්‍රිස්තියානි රාජ්‍ය නොවන සංවිධානවලට බැල මෙහෙකම්කරන පඬියකු අතුරු ප්‍රශ්නයක් ඇසීමට ඉඩ ඇත. මෙරට බෞද්ධ නොවන දේශපාලනඥයන් දළදා වඳිනු අපි දැක ඇත්තෙමු. එහෙත් අපට ප්‍රශ්නය වනුයේ මේ සැදැහැ සිතින් කරන වැඳීමක් ද යන්න ය. ඉහත කී කසිකබල් සමාජවිද්‍යාඥයන්ගේ කෘති කියවීමෙන් හෝ වෙනත් අයුරකින් හෝ අද සිංහල බෞද්ධයන්ගේ සිත දිනාගැනීමේ උප්පර වැට්ටියක බටහිර ක්‍රිස්තියානි දේශපාලකයන් හා රාජ්‍ය නිලධාරීන් යෙදී සිටින බව ඉතා පැහැදිලි ය.

ඕල්කට්තුමා යනු මෙරටට සිංහල බුද්ධාගමක් හඳුන්වාදුන් තැනැත්තා නොව මෙරට ඊනියා උගත් බෞද්ධයනට ක්‍රිස්තියානි සංස්කෘතියෙහි ජීවත්වීමට කියාදුන් තැනැත්තා ය. ඔහුට බුදුදහම ආගමක් පමණක් විය. ඔහු ආගමින් බෞද්ධයෙක් විය. එහෙත් සංස්කෘතියෙන් ක්‍රිස්තියානි විය. ඔහු හඳුන්වා දුන් බුද්ධාගම සිංහල බුද්ධාගමෙන් නැත්නම් සිංහල බුදුසසුනෙන් වෙන්කරගැනීම සඳහා අපි එයට ඕල්කට් බුද්ධාගම යැයි කියමු. එය ඇතැමුන් කියන ප්‍රොතෙස්තන්ත බුද්ධාගම නො වෙයි. ප්‍රොතෙස්තන්ත බුද්ධාගම යන්න පැහැදිලි සංකල්පයක් නො වෙයි. ඒ බටහිර ඇසින් උඩින් පල්ලෙන් සිංහල සමාජය දෙස බලා තනාගත් අනුකාරක වචන දෙකක් පමණ ය. එහි සංගත සංකල්පයක්වත් නැත. ඕල්කට් බුද්ධාගමේ පුරෝගාමී ඕල්කට්තුමාට බ්‍රිතානි විරෝධයක් නම් සමහරවිට තිබෙන්නට ඇත්තේ ඔහු ද බ්‍රිතානින්ට විරුද්ධ යුද්ධයක ස්වේච්ඡා හමුදා නිලධරියකු ලෙස හෝ සහභාගි වී තිබීම හේතුකොටගෙන ය. එහෙත් ඔහු බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට එරෙහි වූවෙක් නො වී ය. ඔහු දළදා වහන්සේ මිනිස් දතක් නො වේ යැයි කීවේ ය.

මෙරට ඇමරිකන් තානාපතිවරයා වඳින්නේ ඕල්කට්තුමා මිනිස් දතක් නො වේ යැයි හැඳින්වූ වස්තුවකට ය. මෙහි වස්තුව යන්න යෙදෙන්නේ තානාපතිවරයාට පුරුදු බටහිර දැනුමේ කියැවෙන ඔබ්ජෙක්ට් යන්නෙහි පරිවර්තනයක් ලෙස බව කිවයුත්තේ වස්තුව යන්නට සිංහල භාෂාවේ වෙනත් තේරුම් ද ඇති බැවින් ය. ඕල්කට්තුමාට නොතිබූ ශ්‍රද්ධාවක් ඇමරිකන් තානාපතිවරයාට ඇතිවන්නේ කෙසේ ද? සොල්හයිම් දණින් වැටී මහානායක හිමිවරුන්ට අටපිරිකර පූජාකරන්නේ ඇයි? මේ වෙන කිසිවකටත් නොව සිංහල බෞද්ධයන්ගේ සිත දිනාගැනීමට ය.

© Prof. Nalin De Silva

අද බටහිරයන්ට ප්‍රශ්නය වී ඇත්තේ සිංහල භික්ෂූන් වහන්සේ හා සාමාන්‍ය සිංහල බෞද්ධයන් බව පැහැදිලි ය. ඊනියා සිංහල දේශපාලනඥයන් ඔවුන්ට කිසි දිනෙක ප්‍රශ්නයක් නො විණි. දේශපාලනඥයෝ බොහෝ විට බටහිරයන්ගේ ම, විශේෂයෙන් ම බ්‍රිතාන්‍යයන්ගේ ම නිෂ්පාදන වූහ. 1817න් පසුව සිංහලයන්ට තමන්ගේම වූ නායකයෝ නැතිවූහ. බ්‍රිතාන්‍යයෝ කොළඹ හා මහනුවර ඇංග්ලිකන් පල්ලියේ හා ආණ්ඩුවේ පාසල් බිහිකර කැප්පෙට්ටිපොළ නිලමේතුමා ආදීන්ගෙන් පසුව ඒ නායකයන්ගේ දරු මුණුබුරන්ට ක්‍රිකට් හා රගර් ක්‍රීඩාකිරීමටත් පසුව තේවතුවල පාලකයන් හා ආණ්ඩුවේ නිලධාරීන් වීමටත් ඉගැන්වූහ. ඕල්කට්තුමා මේ අධ්‍යාපනය වෙනස්කිරීමට කිසිවක් නො කෙළේ ය. ඔහු මුල් වී බිහිකල පාසල්වල සාමාන්‍ය සිංහල බෞද්ධයන්ගේ දරුවෝ ක්‍රිස්තියානි අධ්‍යාපනයක් ලැබූහ. අද ඒ දරුවෝ ද රගර් ක්‍රීඩාවෙහි යෙදෙති.

මුල් කාලයේ සිටම සිංහල බුදුසසුන මෙරට වඩාත්ම අධිරාජ්‍ය විරෝධී සංස්ථාව බව හඳුනාගැනීමට බ්‍රිතාන්‍යයන්ට හැකිවිය. හාමුදුරුවන් කහකඩ හමුදාව ලෙස හැඳින්වූ බ්‍රිතාන්‍යයෝ සිංහල බෞද්ධයනට සිංහල භික්ෂූන් වහන්සේ කළ බලපෑම මැනවින් තේරුම් ගත්හ. භික්ෂූන් වහන්සේ සිටිනතාක් සිංහලයන් තමන්ට අවශ්‍ය ආකාරයට පාලනයකිරීමට නොහැකි බව බ්‍රිතාන්‍යයෝ දැනසිටියහ. එහෙත් බ්‍රිතාන්‍යයන්ගෙන් ඇතැම් කොටසක් උපායශීලිව භික්ෂූන්වහන්සේ හා සිංහල බෞද්ධයන් තම පැත්තට නම්මාගැනීමේ වෑයමක යෙදුණහ.

ඩොයිලි ගැන අපි කලින් සඳහන්කර ඇත්තෙමු. කේම්බ්‍රිජ් විශ්ව විද්‍යාලයේ උපාධිධාරියකු ලෙස ඔහු තම රජුටත් ක්‍රිස්තියානි සංස්කෘතියටත්, රටටත් සේවයකිරීමට කැප වී සිටියේ ය. ඔහු ලංකාවට පැමිණ සිංහල ඉගෙන ගත්තේ ය, ගැමියකු ලෙස ජීවත්වීමට මේ කේම්බ්‍රිජ් උපාධිධරියාට ප්‍රශ්නයක් නො වී ය. ඔහු භික්ෂූන් වහන්සේ ඉතා සමීපයෙන් ඇසුරු කෙළේ ය. එපමණක් නොව ගජමන් නෝනා ද මුළා කෙළේ ය. වචනයේ පරිසාමාප්තාර්ථයෙන් ම කපටියකු වූ ඩොයිලි ගජමන් නෝනා ද සිංහල නායකයන් ද මුළාකර අවසානයේ දී කන්ද උඩරට රාජ්‍යය බොරු ගිවිසුමකින් බ්‍රිතාන්‍යයට යටතට පත් කෙළේ ය. සිංහලය බ්‍රිතාන්‍යයන්ට යටත්කිරීමේ දී කිසිම යුද්ධ නායකයකුට වඩා කාර්යයක් ඩොයිලි අතින් සිදුවිණි.

සිංහලයන්ට පෘතුගීසි සමයේ සිටම බටහිර ගිවිසුම් සම්බන්ධයෙන් ක්‍රියාකරන්නේ කෙසේ ද යන්න ගැන නිසියාකාර අවබෝධයක් තිබී නැති බව පැහැදිලි ය. වර්තමානයේ දී ද ඒ බව පෙනෙන්නට ඇත. ඊනියා අවබෝධතා ගිවිසුම සිංහලයන්ගේ මිනීවල කැපීමකි. එදා සිට අද දක්වා විවිධ තරාතිරම්වල සුද්දෝ මෙරටට එති, යති. ඔවුන්ට අද ඊනියා සිංහල නායකයන්ගෙන් ප්‍රශ්නයක් නැත. රාජ්‍ය නොවන සංවිධානවල වහළුන්ගෙන් ද ප්‍රශ්නයක් නැත. එහෙත් සාමාන්‍ය සිංහල බෞද්ධයෝ මේ සුද්දන් අවශ්වාස කරති. බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට එරෙහිවූ ප්‍රබලම බලවේගය සිංහල බෞද්ධ බලවේගය බව සුද්දෝ දනිති. ඔවුන්ට ඒ බලවේගය එ ජා ප නායකයන් ඔස්සේ මෙන් ම බොරු මාක්ස්වාදී නායකත්වය ඔස්සේ ද යම් ප්‍රමාණයකට බැඳ දැමීමට හැකිවිය. එහෙත් ඒ බලවේගය ශ්‍රී ල නි ප ඔස්සේ යම් ප්‍රමාණයකට ක්‍රියාත්මක විය. අද බටහිරයෝ චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය ඔස්සේ ඒ බලවේගය ද හීලෑ කිරීමට උත්සාහ කරති. බටහිරයන්ට ඇය ගජමන් නෝනා මෙන් මුලාකිරීමේ අවශ්‍යතාවක් නො වී ය. ඇය ඉපිදී ඇත්තේ ම බටහිරයන්ට සේවය කිරීමට ය. ඇය බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ දියණියකි.

අද බටහිරයෝ භික්ෂූන් වහන්සේට සුනාමි ආධාර බෙදීමෙන් මහනායක හිමිවරුන් බැහැදකිමින් දළදා වහන්සේ පුදමින් තමන් සිංහල බෞද්ධයනට සතුරු නොවන බව පෙන්වීමට උත්සාහ කරති. කොටි සංවිධානයට සිය සහයෝගය මුළුමනින් ම දෙන අතර, ඒ නීත්‍යානුකූලකිරීම සඳහා විවිධ සැලැස්ම සකස්කරන අතර සිංහල බෞද්ධයන් ද රැවටීමට යම් පියවරගත යුතු බව ඔවුහු දනිති. එහෙත් අද ඩොයිලිගේ කාලයට වඩා වෙනස් ය. අද අපට ද ප්‍රවාද නිර්මානය කරගැනීමේ හැකියාව ඇත. දැනුම සඳහා අන්තර්ජාලය මත පමණක් යැපීමට අද අපට අවශ්‍ය නො වෙයි. ගොනා හැරෙන්නේ කුමක් සඳහාදැයි අපි දනිමු. නූතන ඩොයිලිලාට කළ යුත්තේ කටුනායකට පාර පෙන්වීම පමණකි. ඒ අතර අපේ දෙපයින් නැගී සිටීමට අප කටයුතු කළ යුතු ය.

© Prof. Nalin De Silva